# කුට්ටම් පොකුණ



ලක්ෂ්මන් කොඩිතුවක්කු

# එස් පියසේන - පුරෝගාමී මාධ්‍යවේදියා

මෙවර කුට්ටම් පොකුණ තීරය වෙන්වන්නේ ජ්‍යෙෂ්ඨ ජනමාධ්‍යවේදියෙකු වන එස් පියසේන මහත්මා වෙනුවෙනි. වසර 90ක් සම්පූර්ණ කළ එතුමා අප අතර සිටින විශිෂ්ටම සේම දැනට ජීවතුන් අතර සිටින පැරණිතම ජනමාධ්‍ය වේදියා වේ. කීර්තිධර මාධ්‍යවේදියෙකු වන එතුමා මාධ්‍යය ක්ෂෙත්‍රය කළ සේවාව සුළුපටු නොවේ. දේශීය මෙන්ම විදේශීය ජනසන්නිවේදන ක්ෂෙත්‍රය ජය ගැන්මට එතුමා දැක්වූ අධිෂ්ඨානය දිරිය ශක්තිය බොහෝය. ශ්‍රී ලංකාවේ ප්‍රථම විධායක ජනාධිපතිවරයාගේ මාධ්‍ය ලේකම් ලෙස කටයුතු කිරීමට එතුමා ඇරයුම් ලබන්නේ එබැවිනි. එතුමා ප්‍රවීන භාෂා පරිවර්තකයෙකි. භාෂා කිහිපයකින් කටයුතු කළ වාමාංශික දේශපාලනය තුළ ජීවත්වෙමින් එම දර්ශනය නියෝජනය කළ සංවේදී දේශපාලකයෙකි. ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ශ්‍රී ලංකාවේ හොඳ නම ආරක්ෂා කිරීමට වෙහෙස මහන්සි වූ රාජ්‍ය තාන්ත්‍රික තානාපතිවරයෙකි. දේශීය මෙන්ම ජාත්‍යන්තර දේශපාලන සංසිද්ධීන් පිළිබඳව සියුම් ඉවක් ඇති පරිණත දේශපාලන විචාරකයෙකි. මිල මුදල් හඹායන සමාජයක මුදලට පයින් ගසා දැනුම දෝතින වැළඳගත් ප්‍රඥාන පිරි අපූරු මිනිසෙකි. අද ජීවත්වන තරුණ ජනමාධ්‍ය වේදීන්ට මෙන්ම ප්‍රවීණයන්ට ද ඔහුගෙන් ලබාගත ඇකකි දැනුම බොහෝය.



ජීවතුන් අතර නැතත් සේනාධීර පියසේනයන් අප සමඟ දීර්ඝායුෂව තවමත් ජීවත්වන්නේ අපේම වාසනාවටය. මිනිසකු මියගියාට පසු මල් පොකුරක් තබා උපහාර පුදන්නට බලා සිටින ජන සමාජයකට

"පියසේන අංකල් කොහොමද ? කවදද අවේ. ආපහු ලංකාවට යනවද ? කොහොමද සැපදුක්. ලංකාවෙ තත්වය කොහොමද ?"

ගුවන් විදුලි සාකච්ඡාව අවසන් විය. "අපි අර ඉස්සරහ පුටුවට ගිහිල්ලා කතා කරමු." ඔහු මට ඉදිරිපස ආසනයක් පෙන්වීය. තරමක් සෙමින් සක්මන් කරන එතුමා සමඟ ගොස් මම වාඩි වුනෙමි.

"පියසේන අන්කල් උපන්නෙ කොයි පළාතෙද ?" මම ඇසුවෙමි.

එසේම ඕස්ට්‍රේලියාවට සංක්‍රමණය වීමෙන් පසු පහන, සන්නස වැනි මාසික සඟරාවලට තම දැනුම බෙදා දෙමින් අප ප්‍රජාවට ඉමහත් සේවයක් සැලසූ ඔහු අප උපදින්නටත් පෙර සිටම තිබූ ශ්‍රී ලංකාවේ දේශපාලන ඉතිහාසය වෙත අප කැන්දාගෙන ගියේය. පුවත්පත්, විද්‍යුත් වැනි ඕනෑම මාධ්‍යයක් තුළ, තම වසර හැත්තෑවක පමණ දේශපාලන දැනුම ශ්‍රී ලාංකීය ජනතාව වෙත ඉමහත් ඇල්මෙන් බෙදාදුන් එතුමා තම අදහස් නොබියව ප්‍රකාශ කළ නිර්භීත මාධ්‍යවේදියෙකි. මෙවැනි ශ්‍රේෂ්ඨ මිනිසුන්ගෙන් ප්‍රයෝජන ගත් අපරටේ දේශපාලන නායකයන් අද

ඔහු ජීවත්ව සිටියදී මල් නොපුදාම බෙදාගත හැකි දැනුම අප්‍රමාණය, අනන්තය. වසර එකහමාරක් පමණ ශ්‍රී ලංකාවේ ජීවත්වෙමින් එතුමා කීපවරක්ම මා සමඟ දුරකථනයෙන් සම්බන්ධ වූයේය. එහෙත් ඔහු සිඩ්නි නිවුරට නැවත පැමිණි බව මා දැන සිටියේ නැත.

"හලෝ මම මේ පියසේන කතා කරන්නේ. කොහෙ-ාමද ලක්ෂමන් සැපදුක් "

මම තරමක් විශ්මයට පත්වීමි. මා ඔහුට කවදත් ඇමතුවේ පියසේන අංකල් කියාය.

නොකඩවා මගේ මුවින් ගිලිහුණු ප්‍රශ්ණ හමුවේ ඔහු නිහඬව සිට නැවත සිනාසිණි.

"වරදක් නැහැ පුතා. දුකකුත් නැහැ සැපකුත් නැහැ. සනීපත් නැහැ. අසනීපත් නැහැ. ලංකාවේ තත්වය හොඳකුත් නරකකුත් නැහැ. ආපහු යන්න නෙවෙයි පුතා ආවේ. මේක අවසාන චාරිකාව. රෝදේ වගේ කැරකිලා කැරකිලා නවතින කාලය ඇවිල්ලා."

වයස අනූවක් සම්පූර්ණ කළද ඔහුගේ සිතිවිලි, හඬ පෞරුෂය තාම තරුණ යැයි මට සිතුණි.

"මේ පැත්තෙ එන්න ලක්ෂමන් මම ඉන්නෙ දුවගේ ගෙදර, මං අළුතින් ලියපු පොතකුත් දෙන්න තියෙනවා. අපි ටිකක් කතා කරමු."

මම පොරොන්දු වූ පරිදි ඔහු මුණගැසීමට ගියෙමි. බතික් සරමකින් හා සුදු කමිසයකින් සැරසී සිටි ඔහු අත හැරමිටියක් තිබුණද තවසත් සෘජුව සිටගනී. දෝතපා මා පිළිගත්තේ සුපුරුදු සිනහව මුව සරසාගෙනය. ඒ අවස්ථාවේදී එතුමා ගුවන් විදුලියට සවන්දී සිටියේය. එහෙත් එය ශ්‍රී ලංකාවේ ගුවන් විදුලි සංස්ථාවෙන් විකාශය කරන්නකි.

"ඔය මං ලංකාවෙ ඉන්න-කොට කරපු සම්මුඛ සාකච්ඡාවක්. අපි ඒක අහලම කතා කරමුද ?"

එය ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ කරුණාරත්න අමරසිංහ මහතා සමඟ කළ දේශපාලන සාකච්ඡාවකි. එම සාකච්ඡාව අතරතුරද එදා ඔහුට අමතක වූ, ගිලිහී ගිය සමහර දේවල් මට නැවත මතක් කරන්නට විය. මැරවරයන් පාතාලය පිරිවරාගෙන දේශපාලනය කරන දේශපාලනය යනු කුමක්දැයි නොදන්නා, ප්‍රඥාවක් ඉවසීමක් නැති අපේ රටේ අඳබාල දේශපාලකයන්ට මෙවැනි මිනිසුන්ගෙන් ලබාගත හැකි දැනුම කොතෙක්ද ? මෙවැනි දේශපාලන පරිණතයන් යොදාගෙන එම දේශපාලකයන් වෙනුවෙන් දේශපාලන හෝඩියේ සිට පාසලක් පටන්ගන්නේ නම් කෙතරම් වටිනේද ? මට එසේ සිතුණි. අද අපේ රටේ සෝදාපාළු වූ දේශපාලන සංස්කෘතිය හරි මඟ ගැනීමට මෙවැනි දක්ෂයින්ගෙන් මෙතුවක් කල් දායකත්වයක් නොගැනීම පිළිබඳව සිතට ඇතිවන්නේ කණගාටුවකි.

මං උපන්නෙ බෙන්තර ගඟ ඉස්මත්තෙ දේවගොඩ කියන සුන්දර ගමේ. මං උසස් අධ්‍යාපනය ලබන කාලේ ලංකාවෙ විශ්ව විද්‍යාල තිබ්බෙ නැහැ. එතකොට අපි සුද්දන්ගෙ යටත් විජිතයක්නෙ. අපි ස්ව උත්සහයෙන් ඉගෙන ගත්ත අය. ඊට පස්සේ මං ඉන්දියාවට ගිය වෙලේ ඉන්දියාවෙ කල්කටා විශ්ව විද්‍යාලයේ වසර දෙකක් ඉගෙන ගත්තා.

"එතකොට පියසේන අන්කල්ට මුලින්ම දේශපාලනය පිළිබඳව ඇල්මක් ඇතිවෙන්නෙ" මම නැවත ඇසුවෙමි.

මුලින්ම මගේ පියාගෙන්. මගේ පියා වාමාංශික ව්‍යාපාරයේ පතාක යෝධයන් සමඟ දේශපාලනය



ලංකා ගුවන් විදුලියේ කාර්ය මණ්ඩලයෙන් අදත් ජීවතුන් සිටින ප්‍රභා රණතුංග හා නන්දා ජයමාන්න මහත්මීන් සමග පියසේන මහතා එහි 60 වැනි සංවත්සරයට සහභාගි වූ අවස්ථාව

කරපු කෙනෙක්. ඔහු සම සමාජ පක්ෂයෙත් ගම් සභාවටත් තරඟ කරපු කෙනෙක්. ඒ ආභාෂය නිසා තමයි මං දේශපාලනයට නැඹුරු වුනෙ. ඔහුගෙන් ලබාගත්ත දැනුම පත පොතින් ලබාගත්ත දැනුමකටත් වඩා ඉහළයි කියලයි දැන් මට හිතෙන්නෙ. මුලිනම මං සමකාලීන ලෝක ඉතිහාසය එම තොරතුරු ඉගෙන ගත්තෙ තාත්තගෙන්. ඔහු ඒවා මට කියලා දුන්නෙ කතන්දර කියලා දෙන්නවගේ හරිම සිත්ගන්නා සුළු විදියට.

"මේ මගේ මිනිපිරී" ඔහු ඉදිරියට විත් මා සමඟ සිනාසුණ දියණිය පෙන්නුවාය.

"එතකොට ඔබගෙ බිරිඳ දරුවො ගැන තොරතුරු කොහොමද ?"

මගේ බිරිඳ 1995 දී ලංකාවට ගිහිල්ලා එනකොට බැංකොක් වලදී හෘදයාබාදයකින් නැතිවුණා. මට දරුවො හතරදෙනයි. එක පුතෙක් පොඩි කාලෙදිම

